# සැළලිහිණි සන්දේශය

## සන්දේශය තුළ ඉදිරිපත් කෙරෙන සමාජ තොරතුරු

1) සුරරද සමන් සමගින් සුරඟන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර
කැරපුද වඳින රැඳි මුනි සිරි පා තඹර
සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර

❖ සුමන සමන් දෙවියන් විසින් දෙවඟනන් සමගින් බුදුරදුන්ගේ සිරි පතුල වෙත පුද පූජා පැවැත්වීම දක්වයි. සුමන සමන් දෙවිඳුන් පිළිබඳ දැක්වීමෙන්, එකල සමාජය තුළ දේව විශ්වාසය තිබූ බව මින් ගම්‍ය වන්නේ සමාජ තොරතුරක් ලෙසිනි.

2) ගනේ මිණි බැබලි කිරණෙවි සතපාය
රනේ යටග සැවුලිඳු දද ගළපාය
අනේ ලකර කළ පුර අප නරපාය
පෙනේ දකුණෑ මහසෙන් දෙව් රද පාය

❖ මෙම පැදියෙන් කතරගම දේවාලය හා කතරගම දෙවියන් පිළිබඳ දක්වා ඇත. මින් නිරූපණය වන්නේ ද එදා සමාජය තුළ දේව විශ්වාසය පැවති බවයි.

## සන්දේශය තුළ ඉදිරිපත් කෙරෙන ආර්ථික තොරතුරු

3) සන්නන් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන
තැන් තැන් වල ම සැතැපී සියුමැලි බැවින
රන්වන් කරල් ගෙනැ එන ගිරවුන් අතින
යන්මන් තොසින් මඟ තොරතුරු නියම දැන

❖ දූතයා ගමන් ගන්නා මාර්ගය තුළ එක් තැනක දී ගිරවුන් රංචුවක් මුණගැසෙයි. උන් පියඹා එන්නේ ඉතා හොඳින් පැසී තිබුණු වී කරල් ද රැගෙනයි. ඒ අනුව මින් නිරූපණය වන්නේ එදා සැළලිහිණියා ගමන් ගත්තේ කුඹුරු අස්වැන්න සරුවට වැවී ඇති කාලයක බවයි. මෙයින් මතුවන්නේ සමෘද්ධිමත් ආර්ථිකයක් එම ප්‍රදේශය තුළ තිබූ බවයි.

4) අයි රාවණ වුවත් නවතන රිසින් එන
අයි රා දහස් දිලි දුනු කොත් අසිපත් ගෙන
කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටින
වයි යා කරන් මල් තුරු ගන වන හිසින

❖ සක් දෙවිඳුන්ගේ හස්තියා වුව ද නැවැත්වීමට ශක්තියක් ඇති බල සේනාවක් එදා සිට ඇත. ඔවුන් සන්තක ව පැවතියේ තියුණු ආයුධයි. ඒවා මුවහත් කොට සකසා ගැනීමට කම්හල් කර්මාන්තය එදා දියුණු ලෙස පැවති බව මින් ගම්‍ය වේ. ඒ අනුව මෙම පැදිය ආර්ථික තොරතුරක් මැනවින් නිරූපණය කර ඇත.

5) නිල තුරඟට නැගෙමින් රිවි දෙව් සිරින
දුල කැරැ සේසත් මිණි බරණ කිරණින
බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානයක සපු කුමරු එන

❖ යාපා පටුන ජයග්‍රහණය කරමින් සපුමල් කුමාරයා තමාගේ සේනාව සමගින් පැමිණෙන බව කවියා දක්වයි. එතුමන්ගේ පැමිණීම කවියා දකින්නේ සූර්ය දිව්‍ය රාජයාගේ පැමිණීම ලෙසයි. එය ''නිල තුරඟට නැගෙමින් රිවි දෙව් සිරින'' යන උපමා යෙදුමෙන් රූපණය කර ඇත.

6) වනසිරි පියුම්රා බැඳි රන බරණ යුරු
වටපිරී සුපුල් දුනුකේ මල් මුරුත තුරු
බිඟුපිරී වැරූ ඔලු පුලැඹුලවල තඹුරු
හිමසරි සිහිල් දිය හෙබ දැක යන් මිතුරු

- දූතයා ගමන් ගන්නා මාර්ගය තුළ මල් පිපුණු මුරුත හා දුනුකේ ගස් හමුවෙයි. වන සිරිය නම් වූ කාන්තාව පැළඳි පද්මරාග මැණික් වලින් සැදි රන් ආභරණ මෙන් ඒවා පෙනෙන බව කවියා දක්වන්නේ අපූරු සංකල්පයක් මවමිනි. එය වඩාත් විචිත්‍රවත් ලෙස පැවසීමට "වනසිරි පියුම්රා බැඳ රන බරණ යුරු" යන උපමා යෙදුම යොදා ඇත.

**සන්දේශය තුළ ඉදිරිපත් කෙරෙන පරිසරයේ වර්ණනාව**

7) රිවිතැවුලේ පිපි කමලේ විල් ගැවසී
මතකොවුලේ තුරු වදුලේ හඬන නිසී
වන සැවුලේ මඟ අසලේ පොර සැලැසී
ගුරුබැවුලේ යව අවුලේ නොවී කිසී

- සිය දූත කාර්යයෙහි නියුතු සැළලිහිණියාට ගුරුබැවුල නම් ප්‍රදේශය හමුවෙයි. එහි දී සූර්යතාපය නිසා සුපිපුණු නෙළුම් මල් සහිත විල් ද ඒ අවට තිබූ ගස්වල නාද කරන මත් වූ කොවුලන් ද දකින දූතයා පොර කොටා ගන්නා වලි කුකුළන් ද දකියි. කවියා මින් අපූරු චමත්කාරජනක පරිසර වර්ණනාවක් මතු කර ඇත.

8) වනසිරි පියුම්රා බැඳි රන බරණ යුරු
වටපිරී සුපුල් දුනුකේ මල් මුරුත තුරු
බිඟුපිරී වැරූ ඔලු පුලැඹුලවල තඹුරු
හිමසරි සිහිල් දිය හෙබ දැක යන් මිතුරු

❖ සැළලිහිණියාට හමුවන්නේ අපූරු වනයකි. එහි මල් සහිත මුරුත ගස් අතර මල් පිපුණු දුනුකේ ගස් තිබේ. එය වන අසිරිය නමැති ශ්‍රී කාන්තාවගේ රතු මැණිකෙන් බැඳි ආභරණ සේ පැදියෙන් දක්වා ඇත්තේ උපමාවක් ලෙසිනි. එසේ ම බමරුන් පිරිවරා සිටින ඕලු මානෙල් නෙළුම් ඇති සීතල ජලයෙන් යුතු ජලාශ ඇති බව ද කවියා දක්වයි. මින් පරිසරයේ චමත්කාරය කවියා මතුකර ඇත.

## සන්දේශය තුළ ඉදිරිපත් කෙරෙන කාව්‍යෝපක්‍රම (අනුප්‍රාසය)

9) වලඳින අදහසින් මෙන් සුර ගඟ   අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ   නැගෙන
වෙල ළඟ ගැවසි මුතු සක් පබළු   බබළන
බල මහ මුහුද එම සඳැ උතුරින්   පෙනෙන

❖ මෙහි දී කවියා දක්වන්නේ උතුරු මුහුදේ වෙරළාසන්නයේ පවතින සුන්දරත්වය දූතයා දකින ආකාරයයි. එහි දී සුළඟේ වේගයෙන් ඉහළ නඟින මහා රළ කවියා මතු කර ඇත්තේ 'ල', 'ළ' යන අක්ෂර සුසංයෝගයෙන් යුතු අනුප්‍රාසය තුළිනි. එය ''නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන'' යන යෙදුමෙන් නිරූපිත වේ.

10) ගව සා සුපුල් කඩුපුල් මල් නිල්   වරල
සල සා උකුළු වට රසුදුළ මිණි   මෙවුල
සල සා දෙතන හර සඳුනෙන් කර   සිහිල
දෙප සා ඉසින නිල් පැහැනෙත දිගු   පුළුල

❖ නාග මාණවිකාවන්ගේ සුන්දරත්වය කවියා මෙහි දී වර්ණනයට නතු කරගෙන ඇත. ඔවුනගේ රූපශ්‍රිය විදහා දක්වන අතර එය වඩාත් උචිත ලෙස දැක්වීමට යෙදූ අනුප්‍රාසයක් පළමු පාදයෙන් හමු වේ. එහි දී 'ල්' ශබ්දය යොදාගත්තේ ''ගවසා සුපුල් කඩුපුල් මල් නිල් වරල'' යන අනුප්‍රාස යෙදුම මගිනි.

## සන්දේශය තුළ ඉදිරිපත් කෙරෙන කාව්‍යෝපක්‍රම (එළිසමය)

11) රිවිතැවුලේ පිපි කමලේ විල් ගැවසී
මතකොවුලේ තුරු වදුලේ හඬන නිසී
වන සැවුලේ මඟ අසලේ පොර සැලැසී
ගුරුබැවුලේ යව අවුලේ නොවී කිසී

❖ ගුරුබැවුල ප්‍රදේශයේ ගමන් ගන්නා දූතයා දකින්නේ අපූරු පරිසරයකි. එහි දී හිරු එළියෙන් පිපුණු මල් වලින් සහිත විල්, මත් වී හඬ ගසන කොවුලන් හා පොර කොටා ගන්නා වලි කුකුළන් දූතයාට දර්ශනය වේ. මෙකී අවස්ථාව චමත්කාරජනක සිදු කිරීම සඳහා සෑම පාදයක ම කවියා 'ලේ' අක්ෂරය පැදි පාද ආරම්භයේ, මධ්‍යයේ යෙදූ අතර අවසානයේ 'සී' අක්ෂරය යොදා ඇත. එමගින් අපූරු එළිසමයක් මතු වී ඇති බව විචාරක අදහසයි.

12) පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
බඳකිකිණිය දදගිහිණිය විමන් වට
නොවපැරණිය වන රමණිය විටින් විට
සැළලිහිණිය වදු කැළණිය පුරව රට

❖ කැළණි පුරවරයට පිවිසෙන දූතයාට එහි ඇති ප්‍රාසාදවල පවතින රමණීය ස්වභාවය කවියා මෙහි දී දක්වයි. ඒ සඳහා එළිසමය අවස්ථා තුනක දී යොදා ඇත. 'ය' අක්ෂරය පැදි පාද ආරම්භයේ, මධ්‍යයේ යෙදූ අතර අවසානයේ 'ට' අක්ෂරය යොදා ඇත. එමගින් අපූරු එළිසමයක් මතු වී ඇති බව විචාරක අදහසයි.